ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

විෂය:- මව්බස

කාර්ය පත්‍රිකාව :- කාර්ය පත්‍රිකා 6

ශ්‍රේණිය:- 5 ශ්‍රේණිය

- පහත සඳහන් ඡේදය කියවා දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

පිටස්තර ජනයා ගෙන් වෙන් වුනු මෙය කඳුකර ඉන්දියානුවන් ගේම ලෝකය විය.මුලු ගමනේදීම අප එකම වාහනයක් වත් නුදුටුවෙමු.අප දුටුවේ බූරුවන් ,කොටළුවන්,සහිත ඉන්දියානු පවුල් පමණි.අපි ගස්වලින් තොර කඳුවලට නැංගෙමු.පතොක් වලින් පිරි කාන්තාර වලින් සැදුනු නිම්නයකට ගියෙමු.හිට හා කර්නශ සුළඟට මුහුණ පෑවේය. හදිස්සියෙන්ම අඩි දොළොස් දහසක් පහළින් ඇත කැලෑව දිස්විය.එහෙත් එවිටම වළා රොදක් පැමිණ අප වසා ගත්තේය.

1) මෙම ඉන්දියානුවන් ඇති කළ සතුන් වර්ග දෙකක් ලියන්න?

.............................................................................................

2) මෙම සතුන් ඇති කරන්නට ඇත්තේ කවර හේතුවක් නිසාදැයි ඔබ සිතන්නේද? ..........................................................................

3) මෙම ඉන්දියානුවන් නූතන ලෝකයේ මිනිසුන්ගෙන් වෙනස් වන්නේ ඇයි? ............................................................................................

4) මෙහි දැක්වෙන කඳුවල විශේෂය කුමක්ද?

...................................................................................................

5) මෙම කාන්තාරවල දැකිය හැකි ශාක වර්ග මොනවාද?

...................................................................................................

6) පහත දැක්වෙන පිළි ඇතුලත් වචන දෙක බැගින් ලියන්න

| දික් ඇද පිල්ල | දික් ඉස්පිල්ල | පාපිල්ල | කොම්බුව හා ඇල පිල්ල |
|---|---|---|---|
| | | | |

7) නාම පද පහ බැගින් යොදා වගුව සම්පූර්ණ කරන්න?

| ස්ත්‍රී ලිංග නාම පද | පුරුෂ ලිංග නාම පද |
|---|---|
| | |

8) සමාන තේරුම් දෙන වචන ලියන්න?

1) කෙත - .......................................................................
2) සූර්යයා -.......................................................................
3) කම්මැළි - .......................................................................
4) ඥානය - .......................................................................
5) ප්‍රීතිය - .......................................................................

9) පහත දැක්වෙන අක්ෂර ඇතුළත් වචන පහ බැගින් ලියන්න?

| දන්තජ “ස” | තලුජ “ශ” | මූර්ධජ “ෂ” |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

10) “අපේ අවුරුදු ජන ක්‍රීඩා” යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න?

## <u>ගීතය</u>

කියන්න සුළඟේ ඔබ කොයි සිටදෝ එන්නනේ

සැරින් සැරේ හෙමින් ඇවිත් හයියෙන් යන්නේ

කොහෙන් කොහොම ආවත් මොකටද විමසන්නේ

<u>වනන්තරේ</u> ඔබ දැක නැති තැනකිනි එන්නේ

හමන තාලයට ගසේ අතුකොළ නැටුවේ

අතර මඟ දී ඔබ එන විට මොනවද දුටුවේ

ගොපලු පුතෙක් ගියා උදේ <u>ගව</u> රැල දක්කා

මට අත වන වන කුඹුරක නැටු හැටි දැක්කා

සමඟි වෙලා තැන තැන යනවාලු එක රැලේ

කැලය මැද දි සත්තු දැක්කෙ  නැත්ද මඳනලේ

<u>කුරුළු</u> මවක් නැතිවුණු පොඩි පැටවෙකු සෙවුවා

තුරුලු කරන් මුව දෙන පැටියට කිරි පෙවුවා

බුදුන්ගෙ සිරිපා ඇති යැයි ලොව **<u>පරසිද්ද</u>**

සමන් ගිර වටේ සුළගේ ඔබ ගියෙ නැත්ද

ඔබත් ළමයො මේ අහන්නේ මොනවද මන්ද

අදත් උදෑසන මා සිරිපාදය වැන්දා

රටත් බලා හැමට **<u>සිසිල</u>** බෙද බෙද දෙන්න

මටත් ඇහැකි නම් ඔබ මෙන් තැන තැන යන්න

පද රචනය:- කරුණාරතන අබේසේකර මහතා

ගායනය:- ලිලන්ති කරුණාරත්න හා ඇනස්ලි මාලෙවන

- **වාචිකව පිළිතුරු සපයන්න**

1) මෙම ගීතය තාලයට ගායනා කරන්න?

2) මෙහි සඳහන් වන දෙබස කා අතර සිදුවන්නක්ද?

3) මෙහි දී සුළඟ දුටු දේවල් මොනවාද ? පවසන්න.

4) මෙහි සුළඟට භාවිත වන වෙනත් නම් මොනවාද?

5) මෙහි ඇතුලත් ක්‍රියා පද පහක් කියන්න?

6) මෙම ගීතයේ ඇතුළත් සිදුවීමක් ගැන වඩාත්ම සිත් ගත් සිදුවීමක් චිත්‍රයට නගන්න?

7) මෙහි ඇති නාම විශේෂණ පද සොයා ලියන්න?

8) ගීතයේ ඉරි ගසා ඇති පදවලට සමාන පද කියන්න

9) මෙවැනි තවත් දෙබසක් ඇති ගීතයක් තාලයට කියන්න?

උදා:- පිං සිදු වන්නේ අනේ බාල ලමුන්නේ

10) ඔබත් මෙවැනි දෙබසක් ඇති ගීතයක් නිර්මාණය කරන්න?

සැකසුම:-එම්.සී.පී.මොරපිටිය මිය

5 ශ්‍රේණිය බාර ආචාර්ය

ර/ඇඹි /විජේරිය ප්‍රාථමික විද්‍යාලය